| කැලණිය අධ්‍යාපන කලාපය |
|---|

| දෙවන වාර පරීක්ෂණය - 2017 |
|---|

| 09 ශ්‍රේණිය | ඉතිහාසය I II | කාලය : පැය 02 |
|---|---|---|

නම : ..........................................................................................................

**I** කොටස

උපදෙස් : සියළුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

---

- 1- 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතීන් අතරින් ඉංග්‍රීසින්ට විශේෂ තැනක් හිමි වන්නේ කුමන හේතුව නිසාද?
    1. විශාල නාවික ශක්තියක් පැවති නිසාය
    2. මුහුදුබඩ ප්‍රදේශ යටත් කරගත් නිසාය
    3. මුළු ශ්‍රී ලංකාවම යටත් කරගත් නිසාය
    4. ඉංග්‍රීසින් තම ආගම ප්‍රචාරය කිරීමට උනන්දු නිසාය

02. ෆ්‍රෙඩ්‍රික් නෝර්ත් ඉංගල් බෙක් ආණ්ඩුකාරයා විසින් තමන් සතු වූ සියලු ප්‍රදේශ පවරා දෙනු ලැබුවේ,
    1. ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමටය
    2. ලන්දේසින්ගේ මව්රට වූ ඕලන්දයේ රජුටය
    3. උඩරට පාලනය කළ රජුටය
    4. ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමටය

03. මාම්පිටිය දිසාව පුස්සැල්ලේ දිසාව පරණාතල හිමියන් පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?
    1. ක්‍රි. ව 1818 අරගලයට සම්බන්ධ වීම
    2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් මරණ දඬුවම පැනවීම
    3. ඉංග්‍රීසින් සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම
    4. බෝගම්බර වැවේ ගිල්වා මරා දැමීම

04. ක්‍රි. ව 1815 ඓතිහාසික ගිවිසුම මගින් උඩරට සිහසුන අහිමි වුයේ කුමන පිරිසකටද?
    1. සිංහල රාජ පරම්පරාවට
    2. සිංහල රදළවරුන්ට
    3. උඩරැටියන්ට
    4. රජුගේ නායක්කර් වංශික ඥාතීන්ට

05. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු විසින් කරවන ලද කලාත්මක නිර්මාණයක් වන්නේ,
    1. දළඳා මාළිගාවේ පත්තිරිප්පුව ය
    2. ශ්‍රී දළඳ ාමාළිගාව ය
    3. සතරමහ දේවාල ය
    4. දළඳා මාළිගාවේ රන් වියන ය

06. ශ්‍රී ලංකාවේ පාලනය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය දක්වා වර්ධනය වීමේ මූලික පියවර තබන්නේ කුමන සිදුවීමක් සමඟද?
    1. ඉංග්‍රීසින් උඩරට යටත් කර ගැනීමත් සමඟය
    2. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ ඉදිරිපත් වීමත් සමඟය
    3. 1848 කැරැල්ලෙන් පසුවය
    4. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඉදිරිපත් වීමත් සමඟය

07. කෝල්බෲක් යෝජනාවලට අනුව ව්‍යවස්ථාදායක සභාවට නිලනොලත් සාමාජිකයන් පත් වනුයේ කුමන ආකාරයකින්ද?
    1. මහජනතාවගේ ඡන්දයෙන්
    2. එංගලන්තයේ රජු විසින් නම් කිරීමෙන්
    3. ආණ්ඩුකාරයා නම් කිරීමෙන්
    4. රජයේ නිලධාරීන් ගෙනි

08. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවලට අයත් විශේෂ ලක්ෂණය මින් කුමක්ද?
    1. සීමිත ඡන්ද බලය ලබාදීම
    2. ජනවාර්ගික නියෝජනය හඳුන්වා දීම
    3. විධායක කාරක සභා හඳුන්වා දීම
    4. පළාත් බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම

09. ඒ ඊ ගුණසිංහ මහතා ඇතුළු කණ්ඩායම ඩොනමෝර් කොමිසම වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම කුමක්ද?
    1. ඉංග්‍රීසි පාලනය තුළ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක්
    2. ඉංග්‍රීසින් හා ලාංකිකයින් එක්ව පාලනය කරන ආණ්ඩුක්‍රමයක්
    3. ෆෙඩරල් ක්‍රමයක් සමඟ උඩරට ස්වයං පාලනයක්
    4. ස්වරාජ්‍ය තත්වයක් ලබා දෙන ආණ්ඩුක්‍රමයක්

10. සුළු ජාතීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම
- බුද්ධිමත් විවාද පැවැත්වීම
- බුද්ධිමතුන් ව්‍යවස්ථාදායක කාර්යයට සම්බන්ධ කර ගැනීම

ඉහත කරුණු ඉටුකර ගැනීම සඳහා පිහිටුවන ලද ආයතනය කුමක්ද?
1. කැබිනට් මණ්ඩලය 2. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 3. උත්තර මන්ත්‍රී මණ්ඩලය 4. රාජ්‍ය සේවා කොමිසම

11. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ යටතේ 1947 පැවැත්වූ ප්‍රථම මැතිවරණයෙන් පසු අගමැති තනතුර හිමි වූයේ,
1. ඩී. එස්. සේනානායක මහතාට ය
2. ඩඩ්ලි සේනානායක මහතාට ය
3. එන්. එම්. පෙරේරා මහතාට ය
4. එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායක මහතාට ය

12. "අ" සහ "ආ" තීර දෙක යටතේ දැක්වෙන තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

| අ | ආ |
|---|---|
| 1. බැප්ටිස්ට් මිෂනාරි සමාගම | A දකුණු ප්‍රදේශය |
| 2. වෙස්ලියන් මිෂනාරි සමාගම | B මහනුවර ප්‍රදේශය |
| 3. චර්ච් මිෂනාරි සමාගම | C කොළඹ ප්‍රදේශය |
| 4. ඇමරිකානු මිෂනාරි සමාගම | D යාපනය ප්‍රදේශය |

1. ABDC 2. CABD 3. CBAD 4. DCBA

13. බෞද්ධයින්ට පොහොය නිවාඩුව ලබා ගැනීමේලා දායකත්වය සැපයූ සමාගම කුමක්ද?
1. මහා බෝධි සමාගම
2. තරුණ බෞද්ධ සමාගම
3. පරම විඥානාර්ථ සමාගම
4. මහා අමද්‍යප සභාව

14. පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයා කවුරුන්ද?
- මුස්ලිම් සිංහල කෝලාහලයේදී සිරභාරයට ගත් නායකයින් බේරා ගැනීමට කටයුතු කිරීම
- ලංකා ජාතික සංගමයේ සභාපතිත්වය දැරීම
- නිදහස් අධ්‍යාපන පනත සම්මත කරවා ගැනීම

1. ජේම්ස් පීරිස් මහතාය
2. පොන්නම්බලම් රාමනාදන් මහතාය
3. ඊ ඩබ් පෙරේරා මහතාය
4. සී ඩබ් ඩබ් කන්නන්ගර මහතාය

15. ක්‍රි. ව 1943 කොමියුනිස්ට් පක්ෂය පිහිටුවා එහි නායකත්වයට පත්වූයේ,
1. එස් ඒ වික්‍රමසිංහ මහතාය
2. ඇන් ඇම් පෙරේරා මහතාය
3. ටී බී ජයා මහතාය
4. ඒ ඊ ගුණසිංහ මහතාය

ප්‍රශ්න අංක 16 සිට 18 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.

16. හින්දු මහන්තාවරයෙකු යටතේ තිබූ __________ ධර්මපාල තුමා විසින් බේරාගෙන බෞද්ධයින්ට ලබා දුනි.
1. බරණැස 2. බුද්ධගයාව 3. ඉසිපතනය 4. මුලගන්ධ කැටි විහාරය

17. ක්‍රි. ව 1915 දී සිංහල මුස්ලිම් කෝලාහලය ආරම්භ වූයේ __________ ප්‍රදේශයෙනි.
1. ගම්පොළ 2. මහනුවර 3. මාතලේ 4. කොළඹ

18. ශ්‍රී ලංකාවේ ප්‍රථම බහුකාර්ය යෝජනා ක්‍රමය වන __________ යෝජනා ක්‍රමය ඩී. එස් සේනානායක මහතා විසින් ආරම්භ කරන ලදී.
1. මීඔය 2. ගල්ඔය 3. කිරිඳිඔය 4. වලවේ ගඟ

19. සර්ජෝන් කොතලාවල මහතාගේ පාලන සමයට සම්බන්ධ විශේෂ සිදුවීමක් සඳහන් පිළිතුර කුමක්ද?
1. නොබැඳි ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලැබීම
2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබීම
3. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
4. බස් ජනසතු කිරීම

20. ශ්‍රී ලංකාවේ අගමැති තනතුර තෙවරක්ම දැරීමට හැකිවූ පුද්ගලයා කවුරුන්ද?
1. එස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක මහතා
2. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය
3. විජයානන්ද දහනායක මහතා
4. ඩඩ්ලි සේනානායක මහතා

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ
- ❖ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුවේ
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

---

01. දෙවන වාරය අවසානයේ ඉතිහාසය විසය සඳහා කරන ලද පාසල් පදනම කරගත් ඇගයීම ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඇගයීම සඳහා කරන ලද ක්‍රියාකාරකම කුමක්ද? (01)
2. ඔබේ කණ්ඩායමට ලැබුන මාතෘකාව කුමක්ද? (01)
3. ඔබ තොරතුරු ලබාගත් මූලාශ්‍රය දෙකක් සඳහන් කරන්න. (02)
4. මෙම ක්‍රියාකාරකම සඳහා ඔබට ගුරුතුමිය/ තුමා ගෙන් ලැබුන උපදෙස් දෙකක් ලියන්න. (04)
5. කණ්ඩායම් ක්‍රියාකාරකමේදී ඔබ ලැබූ අත්දැකීම් දෙකක් සඳහන් කරන්න. (04)
6. ක්‍රියාකරකම අවසන් කළ පසු එයින් ඔබට ලැබුන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (04)

(ලකුණු 16)

02. 1. ක්‍රි. ව 1818 නිදහස් සටනට නායකත්වය දුන් පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (02)
2. නිදහස් සටනට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (04)
3. 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (05)

03. 1. 1848 නිදහස් සටනට හේතු වු බදු වර්ග දෙකක් නම් කරන්න. (02)
2. පහත $A, B, C,$ හා $D$ යටතේ දක්වෙන ප්‍රකාශවලට අදාල තොරතුරු ලියන්න.
A 1848 නිදහස් සටන සමයේ ලංකාවේ සිටි ඉංග්‍රිසි ආණ්ඩුකාර වරයා
B 1848 සටන ආරම්භ වු ප්‍රදේශය
C මුඩු බිම් පනත පැනවු ආණ්ඩුකාරවරයා
D නිදහස් සටනින් පසු වෙඩි තබා ඝාතනය කිරීමට ලක්වු භික්ෂුන් වහන්සේ (04)
3. 1848 දෙවන නිදහස් අරගලයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (05)

04. 1. 1833 ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කල පුද්ගලයින් දෙදෙනා නම් කරන්න. (02)
2. 1833 ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීමට පෙර අවධානය යොමු කල අංශ දෙකක් සඳහන් කරන්න. (04)
3. කෝල්බෲක් ප්‍රතිසංස්කරන මගින් ලංකාවේ පළාත් දහසය පළාත් පහකට බෙදීම නිසා ඇතිවු ප්‍රතිඵල දෙකක් විස්තර කරන්න. (05)

05. 1. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් යෝජනා කල රාජ්‍ය නිළධාරීන් දෙදෙනෙකු නම් කරන්න. (02)

2. පහත $A, B, C,$ හා $D$ යටතේ දැක්වෙන ප්‍රකාශවලට අදාල තොරතුරු ලියන්න

A මුල් වරට ඡන්දබලය ලබාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

B රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කථානායකවරයා

C ශ්‍රී ලාංකික ප්‍රථම අග්‍රාණ්ඩුකාර වරයා

D සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් වූ වර්ෂය (04)

3. ඩොනමෝර් යෝජනා මගින් ඉදිරිපත් කරන ලද විධායක කාරක සභා රටේ සංවර්ධනයට දායක වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (05)

06. 1. බෞද්ධ ආගමික පුනර්ජීවනය උදෙසා ගන්නා ලද *පියවර* දෙකක් සඳහන් කරන්න. (02)

2. ඉස්ලාම් ආගමික පුනර්ජීවනය උදෙසා සිද්ධිලෙබ්බේ මහතා ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (05)

3. අනගාරික ධර්මපාල තුමා විදේශිය රටවල ධර්ම ප්‍රචාරය සඳහා ගන්නා ලද පියවර දෙකක් විස්තර කරන්න. (06)

07. 1. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමට පෙර අත්සන් කරන ලද එකඟතා ගිවිසුම් දෙකක් සඳහන් කරන්න. (02)

2. එස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක මහතාගේ පාලන සමයේ ගන්නා ලද ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (04)

3. ජෝන් කොතලාවල මහතාගේ පාලන සමය ජනතා අප්‍රසාදයට ලක්වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (05)